# 3 ප්‍රධාන දිවැසිවරු

ලේඛක දිවැසිවරුන් කොටස් දෙකකට බෙදන බව පළමු පාඩමේ දී ඉගෙනගත් බව ඔබට මතක ය. එනම්, ප්‍රධාන සහ සුළු දිවැසිවරු වශයෙනි. මෙම පාඩමෙන් ප්‍රධාන දිවැසිවරුන් තිදෙනා පිළිබඳ ව ඔබට ඉගෙනගත හැකි ය. ඔවුන් නම්,

1. යෙසායා
2. ජෙරමියා
3. එසකියෙල්

**යෙසායා දිවැසිවරයා**



3.1 රූපය - යෙසායා දිවැසිවරයා

යෙසායා දිවැසිවරයාගේ නමෙහි අර්ථය "දෙවියන් වහන්සේ ගලවන සේක" යන්න යි. එතුමන් ජීවත් වූයේ ක්‍රි.පූ. 8 වන සියවසේ දී ය. යෙසායා දිවැසිවරයාගේ පියා ආමොස් නමැත්තා ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ජෙරමියා දිවැසිවරයා


3.2 රූපය - ජෙරමියා දිවැසිවරයා

ජෙරමියා දිවැසිවරයාගේ නාමේ අර්ථය "දෙවියන් වහන්සේ උසස් කළ සේක" යන්න ය. එතුමා ජීවත් වූ කාලය ක්‍රි.පූ. 7-6 වන සියවස්වල ය. ජෙරමියා දිවැසිවරායාගේ පියා හිල්කියා නම් වූ පූජකයා ය.

## එසකියෙල් දිවැසිවරයා



3.3 රූපය - එසකියෙල් දිවැසිවරයා

එසකියෙල් දිවැසිවරයාගේ නමෙහි අර්ථය "දෙවියන් වහන්සේ ශලවන සේක"යන්න ය. එතුමන් ජීවත් වූ කාලය ක්‍රි.පූ. 6වන සියවස වූ අතර පියාගේ නම බුසී ය. ඔහු බබිලෝනියේ සිට ඉශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේගේ පණිවිඩය ප්‍රකාශ කළේ ය.

## යෙසායා දිවැසිවරයාගේ කැඳවීම (යෙසායා 6:1-8)

දෙවියන් වහන්සේ උස් වූ උදුර වූ සිංහාසනයක් මත වැඩ සිටි සේක. උන් වහන්සේගේ සළුවෙන් දේව මාලිගාව පිරී තිබුණේ ය. සෙරාප්වරු (දේව දූතයෝ) උන් වහන්සේ සිසාරා සිටියෝ ය. ඔවුනට පියාපත් හය බැගින් තිබිණි. සෙරාප්වරු පියාපත් දෙකකින් තම මුහුණ වසා ගත්තෝ ය. දෙකකින් ඇඟ වසා ගත්තෝ ය. දෙකකින් පියාසර කළෝ ය. එමෙන් ම ඔවුන්ගෙන් එක් කෙනෙක් අනෙකාට හඬ ගසමින් දෙවියන් වහන්සේගේ සුවිශුද්ධ බව මොර ගසා කීවේ ය. එම මොර ගැසීමට දේව මාලිගාවේ අත්තිවාරම සෙළවිණි. එලෙස ම දේව මාලිගාව ද දුමෙන් පිරුණි. යෙසායා දිවැසිවරයා මොර ගසා තමන් අපවිත්‍ර තොල් ඇති මිනිසකු බවත් අපවිත්‍ර තොල් ඇති සෙනඟක් අතර ජීවත් වන බවත් පැවසී ය. එයින් අදහස් කළේ ඔහු පව්කාරයෙකු බව ය. සෙරාප්වරුන්ගෙන් එක් කෙනෙක් පූජාසනය මත්තෙන් ගිනි අඟුරක් අඬුවකින් ගෙන, යෙසායා දිවැසිවරයා වෙත පියාසර කර පැමිණ, එය ඔහුගේ තොල්වල තැවරුවේ ය. ඒ මගින් යෙසායා දිවැසිවරයාගේ පව් කමා කරන ලද බව දන්වී ය. එකෙනෙහිම "මම කවරකු යවම් ද? අප වෙනුවෙන් යන්නේ කවරෙක් ද?" යන දේව හඬ යෙසායා දිවැසිවරයාට ඇසිණි. "මෙන්න මම මෙහි ය, මා යැව්ව මැනව"යි යෙසායා දිවැසිවරයා කීවේ ය.

මේ ලෙසින් යෙසායා දිවැසිවරයා දෙවියන් වහන්සේගේ පණිවුඩය ඉශ්‍රායෙල්වරුන්ට රැගෙන යාමට කැඳවීමක් ලැබී ය.

යෙසායා දිවැසිවරයාගේ කැඳවීම අනුව දේවස්ථානය දෙවියන් වහන්සේ වැඩ සිටින පරිශුද්ධ මාලිගාව බව පැහැදිලි ය. එබැවින් දේවස්ථානයේ පූජනීය බව ආරක්ෂා කළ යුතු ය. එමෙන් ම දේවස්ථානය තුළ සේවයේ නිරත වන විට දේවස්ථානයේ ගරුත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතු ය. එම නිසා;

- දේවස්ථානයට ඇතුළු වන විට දෙදණ නමා, හිස පහත් කර, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට නමස්කාර කළ යුතු ය.
- දේවස්ථානය තුළ ඔබ මොබ දුව පැන ඇවිදීම නොකළ යුතු ය.
- දේවස්ථානය තුළ සිටින විට කෑ ගැසීම, කථා කිරීම නොකළ යුතු ය.
- දේවස්ථානය තුළ ආහාර පාන නොගත යුතු ය.
- පිරිසිදු ව දේවස්ථානයට පැමිණිය යුතු ය.

දිවැසිවරුන් ලද දේව පණිවුඩය ප්‍රකාශ කිරීමේ දී නායකත්වය ගෙන කටයුතු කිරීමට දිවැසිවරුන්ට සිදු විය. අද එම කාර්යය පැවරී ඇත්තේ ප්‍රසාද ස්නාපනය ලද  කිතුනු ඔබට ය. එබැවින් නායකත්වය ගෙන කටයුතු කිරීමේ දී අප තුළ නායකත්ව ගුණාංග ගොඩනගා ගත යුතු ය. ඒවා නම්:

- ආධ්‍යාත්මික ගුණයෙහි වර්ධනය වීම
- අභියෝගවලට මුහුණදීම
- වගකීම් භාර ගැනීම
- සාමූහික ව වැඩ කිරීම
- ජේසුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීම
- සේවා දිවියකට කැපවීම යනාදිය යි.

**ක්‍රියාකාරකම**

1. ප්‍රධාන දිවැසිවරුන් තිදෙනා නම්කර, ඔවුන්ගේ නම්වල අර්ථ, ජීවත් වූ කාලය හා පියවරුන්ගේ නම් වගුගත කරන්න.
2. දේවස්ථානයේ ගරුත්වය ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න.
3. නායකත්වයේ ලක්ෂණ **පහක්** ලියන්න.
4. ඔබේ මීසම තුළ ඔබට සේවය කළ හැකි ආකාර **පහක්** ලියන්න.



**ජීවිතයට බිඳක්**

***වගකීම් භාරගෙන කටයුතු කරන්න.***